00000

රාත්‍රියේ නැවත නිවසට එන්නට සිතක් දිලීප ට නොතිබුණි. එසේ වුව ද නිෂාධි තනිව ම නිවසේ සිටින්නේ ය යන සිතිවිල්ල ඔහුගේ සිතේ වූ අකැමැත්ත යටපත් කළේ ය.

''අද ගෙදර යන්න බැහැ වගේ නම් කිසිම ප්‍රශ්නයක් නැහැ මෙහේ නවතින්න.. ඔයාට පුලුවන් සෝෆා එකේ නිදන්න..'' සඳලි කීවේ ඔහුගේ සිතේ දෙගිඩියාව තේරුම් ගත් බැවිනි.

ඔහු කිසිවක් නොකියා ජනේලයේ පිටත පාර දෙස බලා සිටියේ ය.

''කල්පනා කරන්න එපා.. කණගාටුයි.. මගේ කාමරේ නම් ඉඩ දෙන්න බැහැ..'' ඈ දෙවෙනුව කීවේ සිනාසෙමිණි.

''මම යන්න ඕනෙ..'' ඔහු කීවේ ය. සඳලි කිසිවක් නොකියා සිනාසුණා ය. ඇය ඔහු සමග ම දොර අසළට ආවා ය. දොර අසළ දී ඔහු ආපසු හැරී ඇගේ උරහිස මත සිය අත තැබුවේ ය.

''තෑන්ක් යූ සඳලි.. තෑන්ක් යූ ෆෝ එව්රිතිං..'' ඔහු පහත් හඬින් කීවේ ය.

ඇය ඔහු ගේ අතින් අල්ලා ගත්තේ ය. ''ජස-'ට් අ ස්මෝල් හෙල්ප්... ටු අ ස්පෙෂල් ෆ්‍රෙන්ඩ්.. ටු අ වෙරි ස්පෙෂල් ෆ්‍රෙන්ඩ්..''

ඔහු සිනාසුණේ ය.

''යන්න.. පරිස්සමින් යන්න... හැම දේම හොඳින් අවසන් වෙන්න කියලා මම පතනවා..'' ඈ කීවා ය.

අවසානය කුමක් දැයි නොදන්නන් බියකරු කතාවකට තමා සවන් දෙමින් සිටිනේ යයි ඔහුට සිතුණි. සියල්ල තමාගේ ග්‍රහණයෙන් ගිලිහී ගොස් ඇති යන සිතුවිල්ල නැවත නැවතත් ඔහුට සිතෙයි දැනෙයි. හිසේ තුවාලය වරින් වර රිදුම් දෙයි. එයටත් වඩා රිදුම් දෙන්නේ සිත ය. කිසිවකට කලබල නොවිය යුතුය යන සිතුවිල්ල ඔහු ගේ සිතේ තදින් ම තිබුණි.

රාත්‍රි අන්ධකාරය අතරින් ඇදෙන වාහන වැල මැදින් ඔහු කල්පනාවෙන් බර වූ සිතින් යුතුව සිය වාහනය ඉතා සෙමින් පදවාගෙන ගියේ ය. පසු පසින් එන වාහන වලට තමා අවහිර කරන්නේ ය යන්න පවා ඔහුගේ සිතට ඇතුල් නොවී ය.

0000

අනුරාධ තමාට නියමිත  අසුනේ වාඩි වී කවුළුවෙන් පිටත බැලුවේ ය. රාත්‍රී අන්ධකාරය මැද දැල්වෙන විදුලි බුබුලු ත් ඒ මේ අතය ඇදෙන ගුවන් තොටේ වාහනත් දෙස ඔහු බලා සිටියේ ය.

''හැම තිස්සෙම කල්පනාවෙ.. '' මනීෂා කීවේ ඔහුගේ දකුණත මත සිය වමත තබමිනි. ''.. ඒ ඒ වෙලාවට කරන්න ඕනෙ දේ කරනවා මිසක් කල්පනා කර කර ඉන්න එපා..''

ඔහු ඇය දෙස බලා සිනාසුණේ ය.



''මට කල්පනා කරන්න ගොඩක් දේ තියෙනවා..''

''මට තේරෙනවා... ඒත් ඔයා ඔය වගේ ඔලුව කඩාගෙන කල්පනා කරනවා දකින-කොට දුකයි..''

අනුරාධ සුසුමක් හෙළා කවුළුවෙන් පිටත බැලුවේ ය. ගුවන් යානය ධාවන පථය මත ඉබි ගමනින් ඉදිරියට යයි. තව මො-හොතකින් මහ පොළොවේ බැඳුමින් මිදී එය අහස් ගත වනු ඇත. මේ මොහොතේ නිෂාධි කුමක් කරමින් සිටිනු ඇති ද? ඇයට තමා හමුවන්නට අවකාශයක් ලැබෙනු ඇත් ද? ඉන්පසු කළ යුත්තේ කුමක් ද? සියල්ල මහා අවුලක් සේ ඔහුගේ සිතට වද දෙයි.

''මොන දේ කළත් කල්පනාවෙන් කරපන්.. ආවේගශීලී වෙලා පිස්සු කෙළින්න නම් එපා.. ඒ වගේම කිසිම දේකට සැළෙන්නත් එපා.. ඕනෙම ප්‍රශ්නෙකදි අපි උඹත් එකක් ඉන්නවා.. ඒක අමතක කරන්න එපා.'' ගුවන්තොටුපළේ දී සුනෙත් කී අවසන් වදන් අනුරාධට මතක ය.

දහසක් ප්‍රශ්න හමුවේ දුබල වන සිතට ඒ වදන් මොන තරම් ශක්තියක් ද?

''ඔයා දන්නවද අනුරාධ අයියා.. මේ මං පළවෙනි සැරේට ඔස්ට්‍රේලියාවට යන්නෙ..?''

මනීෂා කීවා ය. ''.. කොහෙද ඉතින්.. අපි වගේ අලුත් අයට ඔයාලට වගේ හැම තිස්සෙම පිටරට යන්න ඉඩ ලැබෙන්නෙ නෑනේ.. ''

''ඒක ගැන ඒ හැටි ලොකුවට හිතන්න එපා.. '' ඔහු කීවේ ය. ''.. මං රටවල් පහළොවකට විතර යන්න ඇති.. ඒත් විශ්වාස කරන්න මාත් මේ රටට යන පළවෙනි වතා ව මේ..''

'හරි පුදුමයිනෙ.. කොහොමද එහෙම වුණේ..?''
''කොහොම හරි එහෙම වුණා.. ''

''ඒක නෙවෙයි.. දන්නවද වැඩක්..?'' ඈ රහසින් ඇසුවා ය.
''මොකක් ද..?''
'' ඩිරෙක්ටර් අයිය හරිම හිතේ අමාරුවෙන් ඉන්නෙ ..''

''ඒ මොකටද..?''

''මට එයා ළඟ සීට් එකක් නොලැබී ඔයා ළඟ සීට් එකක් ලැබුණ එකට..''

''ඒක තමයි ලෝක ස්වභාවය..''
''ඒ මොකක් ද..?''

''ආසාවෙන් ඉන්න මිනිහට ලැබෙන්නෙ නෑ.. කිසිම ඕනෙ කමක් නැති මිනිහට ඉබේ ලැබෙනවා..''

00000

නිෂාධි නැති නිවස පුරා අරක් ගත් පාලුව දරා ගත නොහැකි තරම් යයි දිලීප ට සිතුණි. විදුලි පහන් දල්වන්නටවත් නොවෙහෙසී ඔහු අන්ධකාරයේම සාලයේ සෝපාව මත වාඩි වී දෑස් පියාගත්වන ම කල්පනාවක නිමග්නව සිටියේ ය.

'' බබෙක් බලා ගන්නවා වගේ රැකගන්න එක නෙවෙයි ගෑනියෙකුට ඕනෙ..'' සඳලිගේ වදන් ඔහුට සිහිපත් වෙයි.

ඇගේ කතාවේ අරුත වටහා ගන්නට ඔහු වෙහෙසුණේ ය. නිෂාධි තමන්ගෙන් ඈත්ව ගියේ එනිසා ද..?  එය එක් හේතුවක් පමණක් විය හැකි බව ඔහු දනියි. එහෙත් එයට වඩා බලපෑ හේතුවක් තිබූ බව සඳලිට කෙසේ කියන්න ද? තමාත් නිෂාධිත් අතර පැවති සම්බන්ධය පිළිබඳව සඳලි දන්නේ කුමක් ද..? ලෝකයට රහසක්ව තබා ගත යුතු කොපමණ දේ පවුලක් තුළ තිබිය හැකි ද?

කිසියම් මොහොතක නිෂාධි තමාගෙන් ඈත්ව යාමට නියමිතව සිටි බව තමා නොදැන නොසි-ටිය බව දිලීප දනියි. නොදැන සිටියේ එය සිදුවන්නේ කුමන වේලාවක දැයි යන්න පමණකි ය. දැඩි පාලනයක් තුළ ඇය රඳවා ගනිමින් තමා මේ තාක් කාලයක් වෙහෙසුණේ ඒ දිනය එළැඹීම වළකා ගන්නට නොවේ ද?

කිසිදා කිසිම දෙයකට නොපැරදුණ තමා අද පරාජය හමුවේ බලා සිටින බව සිහිවන විට දිලීප ගේ සිතේ ඇති වන්නේ මහත් කෝපයකි. ජීවිතයේ සියලු අභියෝග හමුවේ නොසැළී ඉදිරියටම ආ තමා මේ අභියෝගය හමුවේදීත් පරදින්නේ කෙසේ ද? නිෂාධිටත් අනුරාධටත් කිසිදා එක්වන්නට නොදිය යුතු ය යන වියරු සිතිවිල්ල ඔහු දැඩිව ග්‍රහණය කර ගත්තේ ය. එය ඔහුගේ සිතට මහත් සැනසිල්ලක් ගෙන දුන්නේ ය.  ඔහු මත්පැන් වීදුරුවේ ඉතිරි අඩ එක වර කටට හලා ගත්තේ ඒ සතුටත් සමගින් ය.

ළබන කළාපයට







